# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1881/6 - 2014 සැප්තැම්බර් මස 22 වැනි සඳුදා - 2014.09.22

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

### ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව

නිවේදනය

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 44 වැනි ව්‍යවස්ථාවේ (1) (අ) වැනි අනුව්‍යවස්ථානුකූලව මා වෙත පැවරී ඇති බලතල ක්‍රියාත්මක කරමින්, ම විසින් 2010 නොවැම්බර් මස 22 වැනි දිනැති 1681/3 දරන අති විශෙෂ ගැසට් පත්‍රයේ පළකරන ලදුව වරින් වර සංශෝධනය කරන ලද නිවේදනය, 2014 සැප්තැම්බර් මස 19 වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි පහත උපලේඛනයේ සඳහන් වන පරිදි තවදුරටත් සංශෝධනය කරනු ලබන බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

මහින්ද රාජපක්ෂ,
ජනාධිපති.

2014 සැප්තැම්බර් මස 20 වැනි දින,
ජනාධිපති කාර්යාලය,
කොළඹ 01.

උපලේඛනය

(1) එම නිවේදනයෙහි ජලසම්පාදන හා ජලාපවහන අමාත්‍ය (අංක 19) ශීර්ෂය සම්බන්ධයෙන් පහත සඳහන් පරිදි :-

(අ) එහි I වන තීරුවෙහි 8 සහ 9 වැනි අයිතමයන් වෙනුවට පහත අයිතමයන් ආදේශ කිරීමෙන් :-
"8. II වැනි තීරුවෙහි දැක්වෙන ආයතනයන්ට පැවරී ඇති අනෙකුත් සියලුම විෂයයන් ;
9. II වැනි තීරුවෙහි දැක්වෙන ආයතනයන් අධීක්ෂණය කිරීම" ;

(ආ) එහි II වැනි තීරුවෙහි I වැනි අයිතමයට පසුව පහත අයිතමය එකතු කිරීමෙන් :-
"2. ජාතික ප්‍රජා ජල සැපයුම් දෙපාර්තමේන්තුව" ;

10 - 339

1A - G 20287 — 355 (2014/09) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.